# කර්තෘකාරක - කර්මකාරක භේදය
## (Active Voice & Passive Voice)

කර්මයක් සහිත (සකර්මක) කිසියම් වාක්‍යයක කර්තෘ උක්ත වී ඇති විට එය කර්තෘකාරක නම් වේ. සකර්මක වාක්‍යයක කර්මය උක්ත වී ඇති විට එය කර්මකාරක නම් වේ. මෙහිලා යම් වාක්‍යයක කර්තෘගේ හෝ කර්මයේ හෝ වෙනසක් සිදු නොවන අතර ප්‍රකාශ කරන ආකාරය සහ උක්තාඛ්‍යාත භාවිතය පමණක් වෙනසකට භාජන වේ.

### කර්තෘකාරක :-

**නිදසුන්:**

1. බළලා මීයන් මරයි.
2. මව්වරු දරුවා නළවති.
3. ඔහු මා එළවයි.
4. ළමයි අප සනසති.
5. අපි ඔවුන් දකිමු.
6. ඇය දරුවන් පෝෂණය කළා ය.
7. ගුරුවරු සිසුන් යහමග යවන්නාහ.
8. වැද්දෝ සතුන් දඩයම් කළහ.
9. විදුහල්පතිතුමා නවක සිසුන් බඳවා ගන්නේ ය.
10 දරුවෝ මව රැකබලා ගත්හ.
11. හාමුදුරුවෝ මා අරමට කැඳවති.
12. වනසත්තු අප බිය ගැන්වූහ.
13. සෙබළු තොප මරන්නාහ.
14. ගම්වැසියෝ අමුණ බඳිති.
15. අක්කා මල්ලී නැළවූවා ය.
16. අයියා නංගීට අකුරු උගන්වන්නේ ය.
17. නුඹ අප රකිහි.
18. මම සොරා එළවූයෙමි.
19. හෙතෙම දෙමාපියන් වඳින්නේ ය.
20. ඔවුහු මා පෝෂණය කරති.
21. ගුරුතුමිය ළමයින් රැක්කාය.
22. තොපි ගොනුන් දක්කන්නෙහු.
23. සිංහයා මුවන් කයි.
24. නිවේදකයා මිනිසුන් රැවටුවේ ය.
25. කොටි හාවුන් අල්ලති.
26. වෙළෙන්දෝ එළුවන් විකුණන්නාහ.
27. මම නුඹට ගසමි.
28. ඇය මනාලියන් හැඩගන්වන්නී ය.
29. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවූහ.
30. භික්ෂුව කුලදරුවන් මහණ කරයි.

# කර්මකාරක :-

**නිදසුන් :**

1. බළලා විසින් මීයෝ මරනු ලැබෙති.
2. මව්වරුන් විසින් දරුවා නළවනු ලබයි.
3. ඔහු විසින් මම එළවනු ලබමි.
4. ළමයින් විසින් අපි සනසනු ලබමු.
5. අප විසින් ඔවුහු දකිනු ලැබෙති.
6. ඇය විසින් දරුවෝ පෝෂණය කරනු ලැබූහ.
7. ගුරුවරුන් විසින් සිසුහු යහමග යවනු ලබන්නාහ.
8. වැද්දන් විසින් සත්තු දඩයම් කරනු ලැබූහ.
9. විදුහල්පතිතුමා විසින් හෙට නවක සිසුහු බඳවා ගනු ලබන්නාහ.
10. දරුවන් විසින් මව රැකබලා ගනු ලැබුවා ය.
11. හාමුදුරුවන් විසින් මම අරමට කැඳවනු ලබමි.
12. වනසතුන් විසින් අපි බිය ගන්වනු ලැබුවෙමු.
13. සෙබළුන් විසින් තොපි මරනු ලබන්නෙහු.
14. ගම්වැසියන් විසින් අමුණ බඳිනු ලබයි.
15. අක්කා විසින් මල්ලී නළවනු ලැබුවේ ය.
16. අයියා විසින් නංගී අකුරු උගන්වනු ලබන්නී ය.
17. නුඹ විසින් අපි රකිනු ලබමු.
18. මා විසින් සොරා එළවනු ලැබුවේ ය.
19. ඔහු විසින් දෙමාපියෝ වඳිනු ලබන්නාහ.
20. ඔවුන් විසින් මම පෝෂණය කරනු ලබමි.
21. ගුරුතුමිය විසින් ළමයි රකිනු ලැබූහ.
22. තොප විසින් ගොන්නු දක්කනු ලබන්නාහ.
23. සිංහයා විසින් මුවෝ කනු ලබති.
24. නිවේදකයා විසින් මිනිස්සු රවටනු ලැබූහ.
25. කොටියන් විසින් හාවෝ අල්ලනු ලබති.
26. වෙළෙන්දන් විසින් එළුවෝ විකුණනු ලබන්නාහ.
27. මා විසින් නුඹ ගසනු ලබහි.
28. ඇය විසින් මනාලියෝ හැඩගන්වනු ලබන්නාහ.
29. බුදුරජාණන් වහන්සේ විසින් ශ්‍රාවකයෝ හික්මවනු ලැබූහ.
30. භික්ෂුව විසින් කුලදරුවෝ පැවිදි කරනු ලබති.